**'පට්ඨානදේශනා මාලාව'**
**'වීජී වාර' 30.01.2020**
**විප්පයුත්ත ප්‍රත්‍යය**

නමොතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස
නමොතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස
නමොතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරිහත් වූ සර්වඥසම්මා සම්බුදුපියාණන් වහන්සේට පරෝපදේශ රහිතව දුක්ඛ ආර්ය සත්‍යය තමන් වහන්සේගේ විසිතුරු නුවණින්ම අවබෝධ කොට ගත්තා වූ පරෝපදේශ රහිතව තණ්හාවේ ස්වභාවය හඳුනාගෙන තමන්වහන්සේ විසින්ම තණ්හාව නැතිකොට වදාළා වූ පරෝපදේශ රහිතව ස්වයම්භූඥානයෙන් අසංඛත ධාතු සංඛ්‍යාත නිර්වාණ ධාතුව අවබෝධ කොට ගත්තා වූ පරෝපදේශ රහිතව මාර්ග ආර්ය සත්‍යය මාර්ගය හැටියට පැහැදිලිව පිරිසිදුව අවබෝධකොට ගෙන උන්වහන්සේත් වැඩුවාවූ ශාන්ති නායක සම්මා සම්බුදුපියාණන් වහන්සේට, ඒ තමන් වහන්සේ අයින් කළ ධර්මයන් අවබෝධ කළ ධර්මයන් සාක්ෂාත් කළ ධර්මයන් වැඩුවා වූ ධර්මයන් ලෝකයාට කරුණාවෙන් ඒ වූ පරිද්දෙන්ම නිර්ලෝභීව මහා කරුණාවෙන් දේශනාකොට වදාළා වූ සත්වයන් හේතු ඵල ධර්මයන්ගෙන් අයින් වෙනවාට බලවත් කැමැත්තක් කරුණාවක් ඇත්තා වූ සත්වයන් දුක් විඳිනවාට කිසිසේත්ම කැමැත්තක් නැත්තා වූ සත්වයන්ගේ නිවීම සත්වයන්ගේ සංසිඳීම නිර්වාණ ධාතුවට පත්වීම ඒකාන්තයෙන්ම කරුණාවෙන් ප්‍රාර්ථනා කළා වූ ශාන්ති නායක සම්මා සම්බුදු පියාණන් වහන්සේට මම සිරසින් වැඳ නමස්කාර කරනවා, මාගේ නමස්කාරය වේවා!

ඒ උතුම් වූ නිර්වාණ ධාතුව සාක්ෂාත් කරගැනීම පිණිස වැඩිය යුතු දියුණු කරගත යුතු ධර්මය දේශනාකොට වදාළ බුදුරජාණන්වහන්සේගේ සන්තානයේ පහළ වූ ධර්ම ස්කන්ධයට ධර්ම රත්නයට නව ලොව්තුරා ශ්‍රී සද්ධර්ම රත්නයට මම නමස්කාර කරනවා, මාගේ නමස්කාරය වේවා!

ඒ ධර්ම මාර්ගය අනුගමනයකොට සිත් නිවා ගත්තා වූ සිත් ශාන්ත කරගත්තා වූ හේතු ඵල ධර්මයන්ගෙන් මිදී ගියා වූ කෙලෙසුන්ගෙන් අයින් උනා වූ කෙලෙසුන්ගෙන් මිදී ගියා වූ අනන්ත අපරිමාණ සංඛ්‍යාවක් දක්වන්න බැරි, ශ්‍රාවක මහා සංඝරත්නයට මම නමස්කාර කරනවා මාගේ නමස්කාරය වේවා!

බුද්ධ රත්නයේ අනන්ත බුදුගුණ බලයෙන් ධර්ම රත්නයේ අනන්ත දහම් ගුණ බලයෙන් සංඝ රත්නයේ අනන්ත සඝ ගුණ බලයෙන් තුනුරුවන් වන්දනා කර ගැනීම තුල පිහිටියා වූ පහළ උනා වූ බලවත් වූ කුසල චේතනාන්ගේ ආනුභාව බලයෙන් මේ පින්වත් අසාගෙන සිටින්නා වූ සියලු දෙනාම වැඩුවා වූ දියුණු කළා වූ පුහුණු කළා වූ සියලුම කුසල ධර්මයන්ගේ ආනුභාව බලයෙන් අදත් මේ වෙලාවේදී මේ පින්වතුන්ට අපි කියලා දෙන්න බලාපොරොත්තුවෙන ධර්ම කොට්ඨාසය ධර්ම කාණ්ඩය සියලුදෙනාටම හොඳින් වැටහේවා! සියලු දෙනාටම හොඳින් අවබෝධ වේවා! සියලු දෙනාටම හොඳින් පැහැදිලි කරගන්න ලැබේවා! ඒ තුලින් සියලු දෙනාගේම සන්තාන තුල පහළ වී එන ක්ලේශ ධර්මයන් තදංග වශයෙන් විෂ්කම්භන වශයෙන් සමුච්ඡේද වශයෙන් ප්‍රහාණය කරගෙන නිර්වාණ ධාතුවෙන් සැනසෙන්න ශක්තිය ලැබේවා! මේ උතුම් ධර්ම සාකච්ඡාව සැමදෙනාටම නිවන් මගක්ම වේවා කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා.

එසේ ප්‍රාර්ථනා කරමින් අපි අදට එක්කාසු කරගත යුතු ධර්ම කොටසක් මේ පින්වතුන්ට මතක් කරනවා. යම් යම් අවස්ථාවලදී අපි මේ ධර්ම කාරණා දිගට කියාගෙන එනකොට අතරමග නතර වීම සිද්ධ උනා. ඒ අතර මග යම් යම් හිඩැස් තිබුණ නිසා සමහර ප්‍රත්‍යය ධර්මයන්ගේ විස්තර විග්‍රහයන් පොඩ්ඩ

පොඩ්ඩ මගහැරී ගිහිල්ලා තිබෙනවා. අපි පසුව විපරම් කරනකොට තමයි ඒවා දැනුනේ. ඒක නිසා අද මේ පින්වතුන්ට මම අන්න ඒ මගහැරී ගිය කොටස් කීපයක් කියලා දෙනවා. එයින් එකක් අද මතක් කරනවා.

ගිය සතියේ අපි මතක් කළේ නත්ථි ප්‍රත්‍යය - විගත ප්‍රත්‍යය සහ අවිගත කියන ප්‍රත්‍යය ධර්මයන් සමග සම්බන්ධ කරලා. ඊළඟට ඒ නත්‍යය ප්‍රත්‍යයට සම්බන්ධ කථා කළ යුතු ගලපා ගන්න සුදුසු ප්‍රත්‍යය ධර්මයක් අපි ඉස්සරහදි මතක් කරනවා. අද අපි මේ පින්වතුන්ට කියලා දෙන්න බලපොරොත්තු වෙන්නේ **විප්පයුත්ත** කියන ප්‍රත්‍යයයි. විප්පයුත්ත කියන ප්‍රත්‍යය මම හිතන්නේ කථා කරන්න අවස්ථාව සැලසුනේ නෑ කියලයි. ඒක නිසා විප්පයුත්ත ප්‍රත්‍යය පිළිබඳව අපි මතු කරලා ගනිමු.

විප්පයුත්ත ප්‍රත්‍යය ගැන කථා කරනකොට සම්පයුත්ත ප්‍රත්‍යය ස්වභාවයත් කියන්න වෙනවා. සම්පයුත්ත ප්‍රත්‍යය - විප්පයුත්ත ප්‍රත්‍යය කියන ධර්මතා දෙක ළඟින් තිබෙන්නේ. සම්පයුත්ත ප්‍රත්‍යය නම් අපිට තේරුම් ගන්න පුළුවන්, අර පළවෙනි ගාථාවත් එක්ක. ඒ තමයි අභිධර්මයට එක්කාසු වෙන අභිධර්මය කුමක්දැයි කියලා තේරුම් ගන්න ඉදිරිපත් වෙන ශ්‍රාවකයන්ට ආදූනිකයන්ට චිත්ත චෛතසික ධර්මයන්ගේ එකට ඉපදීම මේ විදියට කියනවා.

**එකුප්පාදනිරොධා ච, එකාලම්බණවත්ථුකා - චෙතොයුත්තා ද්විපඤ්ඤාස, චිත්තා චෙතසිකා මතා**

චෛතසික ධර්මයන් හිතත් එක්ක උපදින විදියයි මේ කියන්නේ. එතකොට මේ නාම ධර්මයෝ එනම් චිත්ත චෛතසික ධර්මයෝ එකට උපදිනවා. නැතිවෙන කොට එකට නැතිවෙනවා. කොහේ හරි ඉන්නවා නම් එක ආරම්මණයක ඉන්නවා. ආශ්‍රය කරන වස්තුව එකම වස්තුවක් බවට පත්වෙනවා. ඔය විදියට තමයි සම්පයුත්ත ධර්ම ගැන කියන්නේ. ඔය සම්පයුත්ත කථාව චිත්ත චෛතසික නාම ධර්මයන්ට විශේෂයි. රූප ධර්මයන් ඔතැන සම්පයුත්ත වෙනවා කියලා සිත වගේ සම්පයුත්ත වෙන කථාව කියන්නේ නෑ.

අද අපේ පින්වතුන් තේරුම් ගන්න එක හොඳයි **විප්පයුත්ත ප්‍රත්‍යය** කියන එක. විප්පයුත්ත ප්‍රත්‍යය ගැන අපේ පළමු ආචාර්ය පරම්පරාවේ ඉදිරිපත් කරපු ධර්ම විග්‍රහයයි අපිත් පොඩියට සරලව හිතන කරුණු කාරණායි එක්කාසු කරලා මේ පින්වතුන්ට කියලා දෙන්නම්. විප්පයුත්ත ප්‍රත්‍යය කියන එක තේරුම් ගන්න ගියහම පොඩි පටලැවිල්ලක් තිබෙනවා වගේ. විප්පයුත්ත කියන එකේ තේරුම් දිහා බැලුවහමයි තමයි ඒක වෙන්නේ. විප්පයුත්ත කියලා කියන්නේ 'එකට සම්බන්ධ නොවී, එකට ඉන්නේ නැතුව' කියන එකයි. එකට ඉන්නෙත් නෑ නමුත් ප්‍රත්‍යය වෙනවා. ප්‍රත්‍යය වෙනවා කියල කියන්නේ උපකාර වීම. උපකාර වෙන්නේ එකට ඉන්නේ නැතුව. ඔන්න ඔහොම එකක් තමයි මේකේ කියන්නේ. සම්බන්ධතාවයක් නෑ, ඒවගේම එකට ඉන්නේ නෑ, ළඟ පහතක නෑ, නමුත් උපකාරයකුත් කරනවා. ප්‍රත්‍යය වීමකුත් වෙනවා. මේ ගැන හිතනකොට මෙහෙමත් ප්‍රත්‍යයක් තිබෙනවා නේද කියලා හිතෙනවා. උපකාරයක් කරන්න නම් කෙනෙක් ළඟ ඉන්න ඕනෑ, දෙයක් ළඟ තිබෙන්න ඕනෑ, දෙයක් මිශ්‍ර වෙන්න ඕනෑ. මිශ්‍ර වෙච්ච නැති දෙයක් කොහොමද උදව්වක් උපකාරයක් ප්‍රත්‍යයක් වෙන්නේ කියලා හිතෙනවා. නමුත් එහෙම උදව්වක් උපකාරයක් ධර්ම ස්වභාවයක් මේ නාම ධර්ම - රූප ධර්ම වල තිබෙනවා. ඒකයි ඒ විදියට සලකන්න වෙලා තිබෙන්නේ.

මේ ධර්ම කරුණු විස්තර කරන ස්වාමීන්වහන්සේලා ඉදිරිපත් කරලා තිබෙනවා උපමාවක්. ඒ උපමාව තමයි යම්කිසි නෙළුම්කොළයක් උඩට වතුර බිංදුවක් දැම්මහම ඒ නෙළුම් කොළය සමාන්‍යයෙන් පැතලියට තිබුණොත් නෙළුම් කොළය උඩ වතුර ටික තිබෙනවා. ඒක මිණි කැටයක් වගෙයි, බෝලයක් වගේ. ඒ වතුර ටික නෙළුම් කොළයෙන් බිමට වැටෙන්නෙත් නෑ, ඒ වතුර ටික නෙළුම් කොළයේ ගෑවෙන්නෙත් නෑ, ස්පර්ශ වෙන්නෙත් නෑ. ඔන්න ඔය වගේ අමුතු ස්වභාවයක් තිබෙනවා.

ගැවෙන්නේ නැතුව තැවරෙන්නේ නැතුව උදව් උපකාර වෙන ගතියක් තිබෙනවා. මේ විප්පයුත්ත ප්‍රත්‍යය වගේ අපිට ඉන්න පුළුවන්නම් හරි හොඳයි. විප්පයුත්ත ප්‍රත්‍යයේ තිබෙන ගුණය ප්‍රායෝගික ජීවිතියට සම්බන්ධ කරගන්න එක හොඳයි. විප්පයුත්ත ප්‍රත්‍යය ඉතින් අපිට දැනුවත්ව හෝ නොදැනුවත්ව නාම රූප ධර්ම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙනවා. ඒ ක්‍රියාත්මක වෙන ස්වභාවය තේරුම් ගැනීමට දරන උත්සාහයක් තමයි අදත් මේ කරන්නේ. ඕලාරික වූ ලෝකයේ අනිත් පංච ස්කන්ධයන් එක්ක ගනුදෙනු කිරීමේදී විප්පයුත්ත ප්‍රත්‍යයේ තිබෙන්නා වූ ධර්ම ස්වභාවය ගුණ ස්වභාවය අපේ ජීවිතියට පාවිච්චි කරන්න හොඳයි කියලා මට හිතෙනවා.

දැන් අපි අර උපමාවට ගියොත් බලන්න නෙළුම් කොළයක් උඩ තිබෙන්නා වූ ඒ වතුර ටික තැවරෙන්නේ නෑ. ඒක මිශ්‍ර වෙන්නේ නැතුව තිබෙනවා. ඔය නෙළුම් කොළය උඩට වතුර ටිකක් දාලා ඒක අපි ෆොටෝ ගැහුවොත් අපිට වතුරයි කොළෙයි දෙකම එකට වදිනවා. වතුර ටිකත් වදිනවා නෙළුම් කොළෙත් වදිනවා පෙර පසු නොවී. හැබැයි ඒ දෙන්නා කිසිම සම්බන්ධයක් එතැන පවත්වන්නේ නෑ. කිසිම මිශ්‍ර ස්වභාවයක් නෑ. ඔන්න ඔය වගේ එකට තැවරෙන්නේ නැතුව ඉන්න ගතියක් ඕකේ තිබෙනවා. අනිත් එක තමයි බලන්න, මේක හැබැයි යන්නේ ආධාරකයක් විදියට. අපි කෑම කනකොට පිඟානක් පාවිච්චි කරනවා. අපි කිව්වොත් එහෙම ඒකට බත් පිඟාන කියලා පිඟානේ තමයි බත් තියෙන්නේ නමුත් ඒ ආහාර වලට මිශ්‍ර වෙන්නේ නැතුව ඒ පිඟාන ආධාර වෙනවා එහෙම නැත්නම් විප්පයුත්ත සවභාවයෙන් උපකාරයක් දක්වනවා ඒ ආහාර වලට ඉන්න. ඒක හරියට නිශ්‍රය ප්‍රත්‍යය වගෙයි. ඔන්න ඔය වගේ ධර්ම ස්වභායක් ධර්ම ගුණයක් තිබෙනවා ඔය විප්පුත්ත ශක්තියේ. මේ කථාව මෙහෙම කියාගෙන යනකොට අපිට තවත් තැනකට යන්න ඕනෑ.

මේ අභිධර්ම කථනයේම තිබෙන්නේ මුල ඉඳල අග දක්වාම චිත්ත චෛතසික රූප ධර්ම කොටස් කරගෙන නිර්වාණයත් වෙනම දක්වගෙන ඔය පරාස හතරේ තිබෙන්නා වූ විහිදී ගිය සංකීර්ණ, පුංචියට පුංචියට කඩලා පැදුර එලුවා වගේ කරන විස්තරයක් මේකේ තිබෙන්නේ. දිගට එලාගෙන යන එකක් මේකේ තිබෙන්නේ. මේ නාම රූප ධර්ම වල හතර ආකාර ධර්ම වල ධර්මතා තුනක්, ඒ කියන්නේ චිත්ත - චෛතසික - රූප ධර්මයෝ භව සම්බන්ධයෙන් කථා කළහම ඒ භව (කාම භව - රූප භව - අරූප භව) සම්බන්ධයෙන් හිතුවහම මේ චිත්ත චෛතසික ධර්ම යෙදීම එක හා සමානව වෙන්නේ නෑ. මේ ස්ථාන තුනේ එනම් කාම ලෝකයේ - රූප ලෝකයේ - අරූප ලෝකයේ කියන තුනේ මේ චිත්ත චෛතසික රූප වැඩ කරන විදිය එකිනෙකට වෙනස්.

කාම ලෝකයේ චිත්ත චෛතසික රූපයෝ ගොඩ පිටින් මිටි පිටින් රංචු පිටින් ගොඩවල් එක්ක එනවා. ඊළඟට රූප ලෝකයට ගියාට පස්සේ ටිකක් සෞම්‍ය රූප පැත්තට බර වෙනවා. සිත් වශයෙන් ගත්තත් ඒවා කුසල් වශයෙන් විපාක වශයෙන් ගත්තත් සෞම්‍ය සිත් පැත්තට බර වෙනවා. කාම ලෝකයේ දරදඬු සිත්, දරදඬු චෛතසික ස්වභාවයක් තිබෙනවා. ඒවගේම කර්කස ඕලාරික ගොරෝසු රූප ස්වභාවයක් තිබෙනවා. ඊළඟට අරූප ලෝකය පැත්තට හිතාගෙන හිතාගෙන ගියහම අරූප ලෝකයේ ඔය ඕලාරික රූප සම්බන්ධයක් නැතුව නාම ටික විතරක්ම සෞම්‍යය පැත්තට බර වෙලා වැඩ කරනවා. එතකොට මේ ස්ථාන තුනේම චිත්ත චෛතසික රූප එකම ප්‍රමාණයට එකම මට්ටමේ තිබෙන්නේ නෑ. ඒවා අඩු වැඩි වෙනවා. ඔය කාරණය නිසා තමයි මේවා විස්තර කරන කොට **වොකාර** කියන වචනය පාවිච්චි කරලා ඔය ස්ථාන වල ප්‍රභේදය දක්වලා තිබෙන්නේ. ඒකවොකාර - චතුවොකාර - පඤ්චවොකාර කියලා. එතකොට සකන්ධ 5 හම තිබෙන තැන් තිබෙනවා. ස්කන්ධ 4 ක් තිබෙන තැන් තිබෙනවා. ස්කන්ධ එකක් තිබෙනවා. දැන් අපි මේ කථා කරන **විප්පයුත්ත ප්‍රත්‍යය** කියන 'අයින් වෙලා ඒ උනත් උදව්වක් කරන - අයින් වෙලා ඉඳගෙන සහ සම්බන්ධ නොවී උපකාර වෙනවා' කියන මේ විප්පයුත්ත ප්‍රත්‍යය කියනකොට ඕක වැඩ කරනවා කියලා කියන්නේ ස්ථාන දෙකක විතරයි. ඒ කියන්නේ කාම ලෝකයේත් රූප ලෝකයේත් පමණයි. ඒක මෙහෙම වෙන්න හේතුව අපි මීට කලින් අවස්ථාවකදී මතක් කළා සම්පයුත්ත ප්‍රත්‍යය කියන එක. සම්පයුත්ත කියන ප්‍රත්‍යයේදී එකට

යෙදිලා එකට උදව්වෙලා මිශ්‍රවෙලා උදව් උපකාර කරගන්නවා කියන කථාවට ගියහම එතැනදී ගන්නේ 'චිත්ත ධර්මයෝ' 'චෛතසික ධර්මයෝ' ටික විතරයි. ඒ කියන්නේ චිත්තය සහ චිත්ත ගති ටික තමයි එතැනට දාන්නේ. හැබැයි මේ **විප්පයුත්ත ප්‍රත්‍යය** කථාවට එනකොට චිත්ත චෛතසික රූප කියන ස්ථාන තුනම ගන්නවා. ඇයි එහෙම ගත්තේ? එහෙම ගත්තේ මේ රූප කියන ඒවා සිත් නොවෙයි. ඒවා චෛතසිකත් නොවෙයි. රූප වල තිබෙන්නා වූ ස්වභාවය සිත් වලත් නෑ චෛතසික වලත් නෑ. චෛතසික වල තිබෙන ස්වභාවය චිත්තයන්ගේ තිබෙන ස්වභාවය රූපයන්ගේ නෑ. නමුත් මේවා අමුතු විදියට ළංවෙලා ක්‍රියාත්මක වෙනවා. එකම වර්ගයක නොවෙන එකම තත්වයක නොවෙන ධර්මස්වභාවයෝ ළංවෙලා වැඩ කරනවා. ළංවෙලා වැඩ කළාට ගැවෙන්නේ නෑ. තැවරෙන්නේ නෑ. ඒක නිසා මේ කථාව කරනකොට විශේෂයෙන්ම රූපයන්ගේ ස්ථාන හයක් ප්‍රයෝජනයට ගන්නවා.

රූප තිබෙනවා 28. ඒ රූපවල පඨවි - ආපෝ - තේජෝ - වායෝ කියලා මහා භූත රූප තිබෙනවා. ඒ භූත රූපයොත් නොවෙයි මෙතැනට ගන්නේ. මෙහි ප්‍රසාදනිය ගතිය නියෝජනය කරන **රූප හයක්** තිබෙනවා. ඒ තමයි **චක්ඛු ප්‍රසාද රූපය - සෝත ප්‍රසාද රූපය - ඝාන ප්‍රසාද රූපය - ජිව්හා ප්‍රසාද රූපය කාය ප්‍රසාද රූපය** සහ **වත්ථු රූපය.** මේ ස්ථාන හය, මේ රූප ස්වභාව හය මාතෘ ගතිය තිබෙන රූප ස්වභාවයන් එනම් පඨවි - ආපෝ - තේජෝ - වායෝ ඇසුරු කරගෙන තමයි තිබෙන්නේ. ඒ උනාට මෙන්න මේ කියන්නා වූ රූපයෝ (ස්ථාන හය) චිත්ත ධර්මයන් පහළ වෙන්න චෛතසික ධර්මයන් පහළ වෙන්න ground එකක් හැටියට පවතින ධර්ම. භූමියක් හැටියට ආධාරකයක් හැටියට පවතින ධර්ම. නමුත් ඒවා ආධාර වෙලා ඒවා උඩට ගිහිල්ලා ඒවා නිශ්‍රය කරගෙන ඒවා මත තමයි ඔය චිත්තචෛතසික ධර්ම පහළ වෙන්නේ. ඒ උනාට තමන්ට අඩිය ගහගෙන තමන්ට පය ගහගෙන යම්කිසි අරමුණක් අරමුණු කරගන්න උදව් උනත් උපකාර උනත් කවදාකවත්ම ඒ චිත්ත චෛතසික ධර්මයෝ වත්ථු රූපයත් එක්ක ආශ්‍රයක් සහ සම්බන්ධ තාවයක් එකට මිශ්‍ර වීමක් නෑ.

අපි තෙලුයි වතුරයි එක භාජනයකට දැම්මහම ඒ භාජනයේ තමයි තෙල් තිබෙන්නේත්, වතුර තිබෙන්නේත් ඒකෙ. හැබැයි තෙල් තට්ටුවයි ජල තට්ටුවයි එක භාජනයේ හිටියත් කවදාකවත් එක්කාසු වෙන්නේ නෑ. ආන්න ඒවාගේ ස්වභාවයක්, එක තැන හිටියත් චිත්ත චෛතසිකයෝ චක්ඛු ප්‍රසාද රූපයක් එක්ක එකට එක්කාසු වෙන්නේ නෑ. ඒකට කියනවා විප්පයුත්ත ගුණය කියලා. එතකොට ප්‍රසාදය අර චිත්ත චෛතසිකයන්ට එක විදියකට නිශ්‍රය කියන භූමිය වශයෙනුත් පිහිට වෙනවා, නමුත් ඇලෙන්නේ නෑ. සහ සම්බන්ධ වෙන්නේ නැති **විප්පයුත්ත ගුණය** තිබෙනවා.

අනිත් එක තමයි චිත්ත චෛතසික ධර්මයෝ ඔය චක්ඛු ප්‍රසාදය ළඟට ගිහිල්ලා පහළ වෙනවා. ඒ චක්ඛු විඤ්ඤාණය කියන්නේ සිතක්. ඒ සිතේ සර්ව චිත්ත සාධාරණ චෛතසික රංචුවක් ඉන්නවා. ඒ ටික චක්ඛු ප්‍රසාදයේ ආශ්‍රයේ තිබුණාට කවදාකවත් එකට ඉන්නේ නෑ. ඒක නිසා විප්පයුත්ත ස්වභාවය තමයි එතැන තිබෙන්නේ. මේ විදියමයි සෝත ප්‍රසාදය, සෝත විඤ්ඤාණය සද්දයක් හසුකර ගැනීම සඳහා ආශ්‍රය කරගන්න යන්නෙම සෝත ප්‍රසාදය ළඟටයි. ඒ උනාට තැවරෙන්නේ නැතුව ශබ්දය අහලා එනවා. අමුතුම ගුණ ස්වභාවයක්. නාසය සම්බන්ධයෙනුත් එහෙමයි. නිශ්‍රය වෙනවා නමුත් විප්පයුත්තයි. ගැවෙන්නේ නැතුව තැවරෙන්නේ නැතුව චිත්ත චෛතසික ධර්මයන්ට ආධාර වෙන ගතියකුත් තිබෙනවා. චිත්ත චෛතසිකයෝ රූපයන් ආධාර කරගෙන නමුත් ඒවාට සම්බන්ධ වෙන්නේ නැතුව ආරම්මණය දැන ගන්නවා.

දැන් මේ විදියට කථා කරගෙන ගියහම ජිව්හා ප්‍රසාදයත් එහෙමයි, කාය ප්‍රසාදයත් එහෙමයි. ඒවගේමයි හෘදය වත්ථු රූපයත්. වත්ථු රූපය ඉස්සෙල්ලාම මේ චිත්ත චෛතසික ධර්මයන්ට වැඩ කරගන්න විප්පයුත්ත ස්වභාවයෙන් උදව්වෙන උපකාරවෙන පළවෙනි අවස්ථාව තමයි උප්පත්ති අවස්ථාව.

ඒ උප්පත්ති අවස්ථාවේදී වෙන කිසිම චක්ඛු ආදී ප්‍රසාදයක් නෑ. මනස කියන හිතට ඉස්සෙල්ලාම වැඩ කරන්න වස්තුභූත වෙන්නේ ඔය කියන හෘදය වත්ථු රූපය. ඉස්සෙල්ලාම උපදිනකොට හෘදය කියලා හදවතක් කියලා ලොකුවට මස් පිඩුවක් නෑ. එතකොට කෙනෙකුට හිතෙන්න පුළුවන් මොකක්ද මේ කියන්නේ කියලා. තව ඔළුවක් හැදිලත් නෑ, ඇඟක් හැදිලත් නෑ, හදවතක් හැදිලත් නෑ, අතපය හැදිලත් නෑ. නමුත් මෙතනදී පාවිච්චි කරන්නේ වත්ථු රූපය කියන වචනය. පස්සේ කියනවා හෘදය වත්ථු රූපය කියලා. මේ අවස්ථාවේදී කර්මජ වත්ථු රූපය සිතට උපකාර වෙනවා, ඇලීමක් බැඳීමක් මොකක්වත්ම නැතුව. මේක හරිම අමුතු දෙයක්. හරිම අමුතු ධර්මයක්. විදර්ශනා වඩන විදර්ශනා හිතකින් නාම ධර්මයන්ගේ රූප ධර්මයන්ගේ වෙනස් වෙනස් ක්‍රියාවන් වෙනස් වෙනස් ස්වභාවයෝ හිතන මෙනෙහි කරන ප්‍රධාන තැන තමයි සම්මස්සන ඥානය කියලා කියන්නේ. සම්මස්සන ඥානයෙන් කරන්නේ ඒවාගේ ලක්ෂණ - ඒවගේ ගුණ බැලීමයි - ඒවගේ ගති බැලීමයි. නාම ධර්මයෝ මොනවාද ඒවාගේ හැඩරුව බලාගෙන යන එකට මේ විප්පයුත්ත ප්‍රත්‍යය පිළිබඳ කථාව හරිම උපකාර වෙනවා. කර්මජ රූපයක් හැටියට විපාක විඤ්ඤාණයක් එක්ක ඉපදුනාට කවදාකවත් ඒ දෙන්නාගේ එක හා සමාන සම්බන්ධතාවයක් වෙන්නේ නෑ. ඒකියන්නේ ඒකට මිශ්‍ර වීමක් නෑ. නමුත් **විප්පයුත්ත ප්‍රත්‍යයෙන්** ප්‍රත්‍යය වෙනවා.

තවත් අපේ පින්වතුන්ට මේ කථාව කියාගෙන යනකොට තවත් කරුණු තුනක් තිබෙනවා. ඒකත් මීට ඉස්සරවෙලා අවස්ථාවකදී මම කිව්වා වගේ මතකයි. ඒ උනත් මේක නැවතත් කියලා දෙන එක හොඳයි.

අපිට දැනගන්න ඕනෑ එකක් තමයි **සමුට්ඨාන** කියන වචනය. සමුට්ඨාන කියන වචනයෙන් කියන්නේ **හට ගත්තා** කියන එකයි. කර්මයෙන් හටගත්ත කර්මයෙන් ඇති වෙච්ච දේට කියනවා **කර්ම සමුට්ඨාන** කියලා. සිතින් හටගත්ත දේට කියනවා **චිත්ත සමුට්ඨාන** කියලා. ආහාරයෙන් හටගත්ත දේට කියනවා **ආහාර සමුට්ඨාන** කියලා. ඊළඟට සෘතුව නිසා හටගන්නා ඒවාට කියනවා **සෘතු සමුට්ඨාන** කියලා. විශේෂයෙන්ම සමහර රූප තිබෙනවා ඒවා චතු සමුට්ඨානිකයි. චතු සමුට්ඨානික රූප කියලා කියන්නේ හතර වර්ගයේම සමුට්ඨාන රූප තිබෙන තැන. එතන කර්මජ රූප තිබෙනවා - චිත්තජ රූප තිබෙනවා - සෘතුජ රූප තිබෙනවා - ආහාරජ රූප තිබෙනවා. මේ වර්ග හතරේම රූප තිබෙනවා නම් අපි ඒක තේරුම් ගන්නවා චතු සමුට්ඨානික රූප කියලා. සමහර වෙලාවට තිබෙන්නේ රූප වර්ග තුනයි. එතැන කර්මජ රූප තිබෙනවා - චිත්තජ රූප තිබෙනවා - සෘතුජ රූප තිබෙනවා, ආහාරජ සම්බන්ධ වෙලා නෑ. එතකොට කියනවා සමුට්ඨාන තුනක රූපයෝ කියලා.

ඉස්සරවෙලාම අපි පහළ වෙනකොට කර්ම සමුට්ඨාන වෙනවා, ඊට පස්සේ ටික වෙලාවක් යනකොට චිත්ත සමුට්ඨාන වෙනවා - සෘතු සමුට්ඨාන වෙනවා. පස්සෙම තමයි මවු කුසක නම් මවුගේ ආහාර පද්ධතියෙන් මවුගේ ශරීරයෙන් අහාර ලැබෙනකොට තමයි කෙනෙකුගේ ශරීරය චතු සමුට්ඨානික වෙන්නේ. එහෙම නැත්නම් ආරම්භයේදී ඒක සමුට්ඨාන - ද්වි සමුට්ඨාන - ති සමුට්ඨාන වෙනවා.

දැනට අපිට තිබෙන ඇසත් කනත් නාසයත් දිවත් ශරීරයත් වස්තු රූපයත් යන මෙතැන තිබෙනවා ඔය වර්ග හතරම. දැන් මේ කම්මසමුට්ඨාන ප්‍රසාද රූපයට සෘතුවෙන් උදව් වෙන්න ඕනෑ. ආහාරයෙන් උපස්තම්භනය කරන්න ඕනෑ. ඒවගේම හිත නිසත් රූප හැදෙනවා. දැන් මෙතැනදී ඔය ගොනු 4 ම තිබෙනවා. ඒකෙන් කර්ම සමුට්ඨානික රූපය, විඤ්ඤාණයට පහළ වෙන්න උදව් කරනවා උපකාර කරනවා, **නිශ්‍රය වශයෙනුත්** ඒවාගේම **විප්පයුත්ත වශයෙන්** තැවරෙන්නේ නැතුව ගෑවෙන්නේ නැතුව ස්පර්ශ වෙන්නේ නැතුව නමුත් උපකාරයක් කරනවා. මෙන්න මේ වගේ ගති ස්වභාවයක් මේ කථාවේ තිබෙනවා. ඕක තමයි මේ විප්පයුත්ත ප්‍රත්‍යයේ ගතිය.

මම ඉස්සෙල්ලා කිව්වා අපේ ජීවිතියට නාම ධර්මයන්ගේ රූප ධර්මයන්ගේ තිබෙන විප්පයුත්ත ගතිය පාවිච්චියට ගන්නවා නම් හොඳයි කියලා. එහෙම කියන්න හේතුව, ධර්මයන්ගේ තිබෙන ස්වභාවය තමයි කවදාකවත් ඇලෙන්නේ නෑ, ගැවෙන්නේ නෑ, තැවරෙන්නේ නෑ නමුත් උදව් කරනවා. මට හිතිච්ච දෙයක් තමයි මිනිස්සුන්ට අපි උදව්කරන්න ඕනෑ, උපකාර කරන්න ඕනෑ, හැබැයි තැවරෙන්නේ නැතුව. ඇලෙන්නේ නැතුව. ස්පර්ශ වෙන්නේ නැතුව. එහෙම උදව් කරනවා නම් අල කොළයක නෙළුම් පතක වතුර පැවතුනා වගේ නොඇලී නොබැඳී ඒවගේම නොතැවරී උදව් කරහම අපේ හිත හරි ලස්සනට සැහැල්ලුවෙන් බරක් නැතුව තියා ගන්න පුළුවන්. ඒවගේම තෙත් වෙන්නේ නැතුව කර්කශ වෙන්නේ නැතුව ගොරෝසු වෙන්නේ නැතුව. මේ විප්පයුත්ත ප්‍රත්‍යයෙන් අපේ ජීවිතියට එදිනෙදා ගන්න තිබෙන ශ්‍රේෂ්ඨම ගුණ ස්වභාවය නම් උදව්වකුත් කරනවා ඇලීමකුත් නෑ, පිහිටකුත් වෙලා තිබෙනවා නමුත් සම්බන්ධයකුත් නෑ. ඒ තමයි විප්පයුත්ත ප්‍රත්‍යයේ තිබෙන්නා වූ ගුණය.

ඒවගේම තමයි බුදුරජාණන්වහන්සේගේ ජීවිතිය ගැන කියන කොටත් මේ විප්පයුත්ත ප්‍රත්‍යයේ තිබෙන්නා වූ ගතියට සමාන ගුණයක් දක්වනවා. ඒ තමයි බුදුරජාණන් වහන්සේ ලොව්තුරා බුදු කෙනෙක් හැටියට පහළ වෙන්නේ කාම ලෝකයේ. කාම ලෝකයේ තිබෙනවා ස්ථාන 11ක්. ඒ ස්ථාන 11 සැප වශයෙන් grade කරහම සැම සම්පත් තිබෙන විදියට බැලුවහම මේ එකොළහෙන් ඉහළටම යන්නේ පරිනිම්මිත වසවත්ති දිව්‍යලෝකය. පහළටම යන්නේ නරකාදිය. එතකොට මේ ස්ථානවලින් බුදුරජාණන්වහන්සේ පහළ වෙන්නේ පරිනිම්මිත වසවත්ති කියන කාම ලෝකයේ හොඳම සැප කොටස තිබෙන තැන නොවෙයි. ලොව්තුරා බුදුරජාණන්වහන්සේ පහළ වෙන්නේ කාම භූමියේ පහළම නිරාදුක් තිබෙන තැනත් නොවෙයි. දුක් ටිකකුත් තිබෙන සැප ටිකකුත් තිබෙන දුකත් මිශ්‍ර වෙලා තිබෙන සැපත් මිශ්‍ර වෙලා තිබෙන දෙකම එක තැන කථා කරන්න පුළුවන් තැනක් තමයි මනුස්සලෝකය. මේ මනුස්සලෝකයේ කාම සම්පත් පිරිච්ච තැනක තමයි බුදුරජාණන්වහන්සේ උපදින්නේ. එහෙම ඉපදීලා මේ කාම සම්පත් තිබෙන තැන කාම ලෝකයෙන් මතුවෙලා කාම ලෝකයේ ඉපදිලා මේ නාම රූප ධර්ම අස්සේ ඉපදුනත් පහළ උනත් ලොව්තුරා බුදුරජාණන්වහන්සේ කාම ධර්මයන්ට නොඇලී නොතැවරී ඒවා නොපතා නෙළුම් පතක ස්වභාවය ඇති කරගෙන උන්වහන්සේ ලෝකයේ වැඩ ඉන්නවා. බුදුරජාණන්වහන්සේට ඔවැනි උතුම් ගුණයක් තිබෙනවා. මේ ලෝකයාට පිහිට වෙන්නේ උන්වහන්සේ කිසිම දෙයක් පතන්නේ නැතුව, බලාපොරොත්තු වෙන්නේ නැතුව. අපි තමයි ඒකෙ ප්‍රත්‍යය ලබන්නේ. නමුත් බුදුරජාණන්වහන්සේ අපි කෙරෙහි ඇලීමකුත් නෑ අපි කෙරෙහි බැඳීමකුත් නෑ.

මේ **විප්පුත්ත ප්‍රත්‍යය** පිළිබඳ හිතාගෙන යනකොට මට ගොඩක් සිතුවිලි පහළ උනා. ප්‍රත්‍යය කියන වචනය දිහා බලනකොට ඒකෙ තේරුම උදව් උපකාර වෙනවා කියන එකයි. හැබැයි විප්පුත්ත කියන වචනය දිහා බැලුවහම තිබෙන්නේ සහ සම්බන්ධ වෙන්නේ නැතුව ඇලෙන්නේ නැතුව බැඳෙන්නේ නැතුව කියන එකයි. බුදුරජාණන් ශ්‍රාවකයන්ට උනත් පිහිට වෙනවා නමුත් ඇලීමක් නම් නෑ. දානයට යනවා, වළඳනවා නමුත් ඇලීමක් නෑ බැඳීමක් නෑ.

මේ නාම රූප ධර්මයන්ට ලෝකයේ තිබෙන රූප ධර්මයෝ - ලෝකයේ තිබෙන ශබ්ද ධර්මයෝ - ගන්ධ ධර්මයෝ - රස ස්වභාවයෝ - ස්පර්ශ ස්වභාවයෝ පිළිබඳව අරමුණු කරන්න මේවා ගැන හිතන්න මේ කියන්නා වූ ස්ථාන 6, චක්ඛු - සෝත - ඝාන - ජිව්හා කාය සහ වත්ථු රූප යන මේ හය අර නාම ධර්මයන්ට ආධාර වෙනවා. ඒවගේම තමයි නාම ධර්ම නිසා මේ රූප ස්වභාවයෝ තරවෙන ස්වභාවයක් තිබෙනවා. මෙන්න මේ කියන්නා වූ ඔවුනොවුන්ට තැවරෙන්නේ නැතුව උදව් කරන මේ ප්‍රත්‍යය හරිම වටිනවා. මේ විප්පයුත්ත ප්‍රත්‍යය අපි දැනගත යුතු අපි හොඳට සිතිය යුතු මේ විප්පයුත්ත ප්‍රත්‍යයේ ගුණයක් අපිට එක්කාසු කරගන්න හැකියාවක් තිබිය යුතු ප්‍රත්‍යයක්. මේ ප්‍රත්‍යය ගැන මට මතක හැටියට අපි මීට ඉස්සරවෙලා කිව්වේ නෑ.

මේ පට්ඨාන කථාව පටන් ගන්නකොට අපි කරුණු තුනක් ඉස්සෙල්ලා කියලා දුන්නා. එයින් කරුණු දෙකක් අපි වැඩියෙන් කථා කළා. එකක් වැඩිපුර කථා කළේ නෑ අපේ ආධුනික අයට ටිකක් හැල හැප්පෙන ගතියක් තිබෙන නිසා. ඒ තමයි ප්‍රත්‍යය ධර්මය - ප්‍රත්‍යය උප්පන්නය ධර්මය - ප්‍රත්‍යය නීක ධර්මය කියලා අපි වචන තුනක් කියලා දුන්නා.

- එයින් **ප්‍රත්‍යය** කියලා කිව්වේ යමකට උපකාර වෙන ධර්මය.
- **ප්‍රත්‍යය උප්පන්නය** කියලා කියන්නේ ඒ උපකාරය ලබන ධර්මය. ඒ උපකාරයෙන් මතුවෙන ධර්මය. ඒ උපකාරය ලබාගෙන ඒ උපකාරය විඳින ධර්මය.
- ප්‍රත්‍යය නීකය කියලා කියන්නේ උපකාරයක් ලබන්නේ නැතුව ඉන්න ධර්ම. ඒ ධර්මය තිබෙනවා නමුත් ප්‍රත්‍යයෙන් උපකාරයක් ලබන්නේ නෑ. අර ප්‍රත්‍යය ධර්මයට මෙයාට උපකාරයක් කරන්නත් බෑ, ළඟින් හිටියත් ප්‍රත්‍යයනීක ධර්ම වලට උපකාරයක් ලබන්නත් බෑ. ඒවගේ උපකාරයක් ඉල්ලන්නෙත් නැති ඒවගේම ඒකට ලැබෙන්නෙත් නැති ධර්ම.

ප්‍රත්‍යය ධර්මය කියලා කියන්නේ උදව්වක් කරන්න හැකියාවක් තිබෙන ධර්මය. ඒ හැකියාවට කියනවා **ප්‍රත්‍යය ශක්තිය** කියලා. ප්‍රත්‍යය ශක්තියක් තිබෙන හින්දා තමයි ප්‍රත්‍යය වෙන්නේ. උදව් කරන්න හැකියාවක් තිබෙන හින්දා තමයි උදව් කරන්නේ. ඔය ධර්ම පිංතූරය හිතේ හදාගෙන හිතේ මවාගෙන ඇවිල්ලා මේ විප්පයුත්ත ප්‍රත්‍යයට දාපු ගමන් අපේ හිත හැප්පෙනවා. හැප්පෙන්නේ, මේ විප්පුත්ත ප්‍රත්‍යය ස්වභාවය කොහොමද අනිත් එක්කෙනාට ප්‍රත්‍යය වෙන්නේ කියන එක. ඒක නිසා පට්ඨානය පිළිබඳව අපි විස්තර වශයෙන් මේ විදියට හිතනකොට මේ විප්පයුත්ත ප්‍රත්‍යය ධර්මයයි ඒකෙන් ආධාර ලබන ප්‍රත්‍යය උප්පන්න ධර්මයයි එක ළඟට ගිහිල්ලා එකට සම්බන්ධ වෙලා ඉන්නවා කියලා තේරුම් ගන්න අපිට පහසු වෙන්නේ නෑ, මිශ්‍ර වෙන්නේ නැති නිසා. අර නෙළුම් කොළේ වතුර මිශ්‍ර වෙන්නේ නෑ. මිශ්‍ර වෙන ගතියක් තිබුණා නම් අපිට තේරුම් ගන්න පහසු වෙනවා එකක් අනෙකට උදව් කරනවා අනික උදව්ව ලබනවා කියලා. නමුත් මේ විප්පයුත්ත ප්‍රත්‍යය එහෙම වෙන්නේ නැතුවත් උදව් කරන ගතියක් මේකේ තිබෙනවා. ඔය විදියට අපි මේ චිත්ත චෛතසික ධර්මයන්ගේ තිබෙන්නා වූ මේ අමුතු විදියේ උපකාරක ස්වභාවය තේරුම් ගන්න ඕනෑ.

මම මෙච්චර වෙලා මේ පින්වතුන්ට මේකේ තිබෙන්නා වූ හැල හැප්පෙන ගති ටික තමයි ඔය කියලා දුන්නේ. දැන් අපි බලමු මෙය සිදුවෙන තැන්. කාම ලෝකයේ අපිට පහළ වෙනවා කුසල් සිත් 21 ක්. අකුසල් සිත් 12 පහළ වෙනවා. මේ විප්පයුත්ත කථාවට රූපත් තිබිය යුතුයි. මනුස්සයෙක් බොහෝම ශ්‍රද්ධාවෙන් අනුරාධපුරයට ගිහිල්ලා අත්දෙක එකතු කරගෙන රුවන්වැලි සෑය දිහා බලාගෙන වඳිනවා. වඳිනකොට මේ කෙනාගේ ද්වාර දෙකක් ක්‍රියාත්මක වෙනවා. එකක් තමයි චක්ඛු ප්‍රසාදය. චක්ඛු ප්‍රසාද රූපය අල්ලාගෙන එයාගේ චක්ඛු විඤ්ඤාණයෙන් සවර්ණමාලී චෛත්‍ය රාජයාණන් වහන්සේ අරමුණු කරනවා. ඒක විපාක සිතක්. දැන් සම්පටිච්ඡන සන්තීරණ වලට ගිහිල්ලා ඇතුලේ අනුරාධපුර සවර්ණමාලී චෛත්‍යරාජයාණන් වහන්සේගේ පිංතූරය මනෝද්වාරයට වද්දා ගන්නවා. ඒ කියන්නේ ඉතිරි හරිය සම්පටිච්ඡන සන්තීරණ වොත්ථපන ජවන් වශයෙන් සැදැහැබර කුසල් සිත් පහළ වෙනවා.

මේ සැදැහැබර සිත **සෝමනස්ස සහගත** වශයෙන් **ඥාන සම්ප්‍රයුක්ත** වශයෙන් **අසංඛාරික** වශයෙන් කුසල ධර්මයෝ ටික ඇතුලත සෞම්‍ය විදියට මතු වෙවී මතු වෙවී යන්නේ අර වත්ථු රූපය ළඟ ඉඳගෙනයි. නමුත් වත්ථු රූපය ළඟ ඉඳගෙන මේ ටික පහළ උනත් ඒ වත්ථු රූපය ඒ කුසල් සිත් වලට ඉන්න නිශ්‍රය උනත් එය විප්පයුත්තයි.

චක්ඛු ප්‍රසාදය අනුරාධපුර ස්වර්ණමාලී චෛත්‍ය රාජයන්වහන්සේ අරමුණු කරන්න චිත්ත චෛතසික ධර්මයන්ට උපකාරත් වෙනවා නමුත් විප්පයුත්තයි. මේ විප්පයුත්ත ගතිය විශේෂයෙන් දක්වන්නේ නාම ධර්මයෝ රූපයන්ට. ඔන්න ඔය ස්වභාවය තේරුම් අපිට ගන්න පුළුවන්, මගේ සිත මේ වෙලාවේදී සිද්ධ කරන දේ කියලා.

දැන් මම මෙහෙ ඉඳලා වචන හසුරුවනවා. කථා කරනවා. ඒ කථා කරන වචන ටික ග්‍රහණය කරගන්නේ ඔය පින්වතුන්ගේ කරුණු 2 කින්. එකක් තමයි සෝත ප්‍රසාදය. අනිත් එක තමයි වත්ථු රූපය. සෝත ප්‍රසාදය ආධාර කරගෙන සෝත විඤ්ඤාණ පහළ වෙනවා, ශබ්දය ග්‍රහණය කරනවා. මේ පින්වතුන්ගේ ළඟ තිබෙන්නා වූ ඒ සෝත ප්‍රසාදයයි සෝත විඤ්ඤාණයයි චෛතසික ටිකයි ක්‍රියාත්මක වෙනවා සෙරෙප්පු දාගෙන ගෙදරට ගොඩ උනා වගේ. කෙනෙක් සෙරෙප්පු සපත්තු දාන්නේ නැතුව ආවොත් ඒ ගෙදර තමන්ගේ කකුලේ තැවරෙනවා. තමන් ඒ ගෙදර පොළොවේ ස්පර්ශවෙනවා. සෙරෙප්පු දෙකක් දාගෙන ආවහම තැවරෙන්නේ නෑ. නාම රූප ධර්මයෝ සෙරෙප්පු සපත්තු දාගෙන යන්නේ නෑ. නමුත් ඒවගේ මේ සෝත ප්‍රසාදය මේ වචන ටික ගන්නවා. ගන්න වචන ටිකේ තිබෙන්නා වූ ස්වරූපය නැවත භාර දෙනවා ඇතුලාන්තයේ දුවන්නා වූ මනෝ ද්වාරික චිත්ත චෛතසික ධර්මයන්ට. ඒවා ආශ්‍රය කරගන්නේ වත්ථු රූපයයි. ඒ දෙගොල්ල හැම තැනම උදව් කරනවා, නමුත් විප්පයුත්තයි. මෙහි තිබෙන විසිතුරුම දේ තමයි නාම ධර්ම රූපධර්ම එකට එක්වෙන්නේ නැතුව හසුරුවනවා වගේ අපේ හිතත් ඒ විදියට නොඇලී නොබැඳී නොතැවරී ලෝකයට සම්බන්ධ කරන්නේ නැතුව ගුණ වඩාගෙන ධර්මය වඩාගෙන අපිට නිවන් යන්න පුළුවන්. මම මේ අවස්ථාවේදී ඔන්න ඔය කථාව තමයි මේ පින්වතුන්ට කියලා දුන්නේ, චිත්ත වීථි එක්කාසු කරගන්නේ නැතුව.

කුසල සිත් 21 කම පහළ වෙන්නේ හෘදය වත්ථු රූපය නිශ්‍රය කරගෙන විප්පයුත්ත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය ලබමින්. අකුසල සිත් 12 ත් ඒවගෙයි. අකුසල් ජවන් පහළ වෙන්නේ වත්ථු රූපය ආධාරකරගෙන, නිශ්‍රය කරගෙන විප්පයුත්ත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය ලබමින්. මෙන්න මේ විදයට තමයි මේ ප්‍රත්‍යය ක්‍රියාත්මක වෙන්නේ. ඉතින් මේ පින්වතුන්ට මේ කියලා දීපු ටික විප්පයුත්ත ප්‍රත්‍යය කියන එක මොකක්ද කියලා තේරුම් ගැනීමට උපකාරයක් උනානම් හරිම වටිනවා. ඊළඟට මේ ගැන හිතාගෙන යනකොට තව එකක් කෙටියෙන් හිතාගන්න අපේ පින්වතුන් සම්පයුත්ත ප්‍රත්‍යය කියන එක කථා කරනකොට නාම ධර්මයෝ ටික පමණක් වෙන්කර ගන්න. විප්පයුත්ත ප්‍රත්‍යය ගන්නකොට නාම ධර්මයයි රූප ධර්මයයි දෙකම එකට අරගෙන මේ කාරණය තේරුම් ගන්න. සැම දෙනාටම සුවසේම පැහැදිලිව පිරිසිදුව ධර්මය තේරුම් අරගෙන ධර්මය අවබෝධ කරගෙන ඒවගේම නොඇලී නොබැඳී නොතැරවෙන හිතක් හදාගෙන එහෙත් ලෝකයාට කරුණාවෙන් උදව්වෙලා උපකාර වෙලා ගුණ පුරාගෙන පාරමී පුරාගෙන උතුම් අමාමහ නිවනින් සැනසෙන්න ලැබේවා කියලා බොහෝම මෛත්‍රීයෙන් කරුණාවෙන් පිං දෙනවා, සැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධු ! සාධු ! සාධු !

<u>ජයන්ත මහත්මයා</u> - අප්‍රමාණ පිං ස්වාමීන් වහන්ස ඔබවහන්සේ පසුගිය දේශනා වලට යොමුවෙලා තව දුරටත් පැහදිලි කර දිය යුත්තක් තමයි අද දවසේ පැහැදිලි කර දුන්නේ ඒ පිළිබඳව අප්‍රමාණ පිං අනුමෝදනා කරනවා ස්වාමීන්වහන්ස. ඒවගේම ස්වාමීන් වහන්ස ඔබ වහන්සේ අවසාන වශයෙන් අපිට පොඩි මතක් කිරීමකුත් කළා සම්පයුත්ත ප්‍රත්‍යය කිව්වහම එතැන නාම ධර්මයන් සම්පයුත්ත වෙන ආකාරයත්, විප්පයුත්ත කිව්වහම නාම ධර්මයන් සහ රූප ධර්මයන් එකිනෙකාගෙන් වෙන් වීමක් තිබෙන බවත් ඒවගේම ඒවා විප්පයුත්ත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන බවත් අපි මතක් කරලා දුන්නා. ඔබ වහන්සේ ප්‍රකාශ කළ පරිදි විප්පයුත්ත ප්‍රත්‍යය කියනකොට නිතරම හිතෙන්නේ එකතු නොවී කොහොමද මේ විප්පයුත්ට ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන්නේ කියලා. නමුත් දැන් අපිට තේරෙනවා වත්ථු රූපය කොයි විදියටද කුසල් සිත් වලටත් අකුසල් සිත් වලටත් ප්‍රත්‍යය වෙන්නේ කියලා. ඒ වත්ථු

රූපය නිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වෙනවා නමුත් එතැන විප්පයුත්ත ප්‍රත්‍යයක් තමයි තිබෙන්නේ කියලා මෙතැනදී විස්තර උනේ. ඔබ වහන්සේට අප්‍රමාණ පිං! තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන් වහන්ස එක තැනක 'නාම ධර්මයන් නිසා රූප ධර්මයන් තර වෙනවා' කියලා කියපු තැන පොඩ්ඩක් තේරුණේ නෑ ස්වාමීන් වහන්ස, එතැන පොඩ්ඩක් තේරුම් කරලා දෙන්න ස්වාමීන්වහන්ස, ගොඩක් පිං ඔබ වහන්සේට.

<u>පිළිතුර</u> - නාම ධර්මයෝ නිසා රූප ධර්මයෝ තර වෙනවා කියන එකෙන් අදහස් කළේ උපස්තම්භනයයි. දැන් බලන්න අපි දැනගෙන තිබෙනවා, ඉගෙනගෙන තිබෙනවා සිතක තිබෙන ආයුෂයයි රූපයක තිබෙන්නා වූ ආයුෂයයි සම නොවේ කියලා. චිත්තයක ආයුෂය චිත්තක්ෂණයයි. ඒ චිත්තක්ෂණය වගේ 17 ප්‍රමාණයක් රූපයක ආයුෂයයි කියලා. එතකොට එක වෙලාවක සිතක් එක්ක රූපයක් පහළ උනොත්, උදාහරණයක් හැටියට පළවෙනි චිත්තක්ෂණයේදීම නාමය ඉවරවෙලා යනවා. ඒ උනාව රූපය දෙවෙනි ඒකේ ඉන්නවා. දෙවෙනි එකේ ඉන්නකොට අර කලින් නැතිවෙලා ගිය නාමයේ ශක්තිය ලබාගෙන ටිකක් බලවත් වෙලා තව හිතක් පහළ වෙනවා. එතකොට දෙවෙනි හිත පළවෙනි එකට වඩා ආරම්මණ වශයෙන් හරි වැඩ කිරීම් වශයෙන් හරි පොඩ්ඩක් හයිය ගතියක් හදාගෙන එනවා. එතකොටත් අර පළවෙනියට පහළ වෙච්ච රූපය තිබෙනවා. ඊළඟට ටිකක් ඈතට යනකොට සමාන්‍යයෙන් චිත්තක්ෂණ 15 විතර යනකොට ජවන් හරියට යනකොට රූපයන්ටත් හරිහමක් වැඩක් කරන්න සිද්ධ වෙනවා. අමුතු ගතියක් තිබෙනවා. ඉස්සරවෙලා පහළ වෙච්ච එකක් වගේ නොවෙයි. ඒක නිසා ඒකට කියනවා මේ රූපයෝ බලවත් වෙනවා කියලා. උපස්ම්භන කථාව තමයි කියන්නේ. ඒකත් හරිම සියුම්. විප්පයුත්ත ස්වභාවයට සම්බන්ධ කරලා කියනකොට තමයි ඕක වෙන්නේ.

නැත්නම් හිතන්න පුලුවන් මෙහෙම. මෙතැන විප්පයුත්තයි කියලා කියනවා නාම ධර්මයෝ . එතකොට එකතු වෙන්නේ නැතුව ඒක ලබන්නේ කොහොමද කියලා ප්‍රශ්නය එනවා. ඒක වෙන්නේ ඒකට තැවරෙන්නේ නැතුව ඒ ඇතිවෙනා වූ චෛතසික ධර්මයන්ට රූප ධර්මයන්ට වැඩ කිරීමට උපකාරයක් වෙනවා කියන තැන එහෙමයි ඕක සලකා ගන්නේ. තෙරුවන් සරණයි!

<u>බෲනෝ මහත්මයා</u> - අවසරයි ස්වාමීන් වහන්ස ඔබ වහන්සේ කියපු දේ හොඳටම තේරුණා. අර චිත්තජ රූප වලට කොහොමද විප්පයුත්ත ප්‍රත්‍යය ඇතිවෙන්නේ කියලා. ස්වාමීන් වහන්සේගේ විස්තරයෙන් පස්සේ වත්ථු රූප ඇතිවෙන හැටි විප්පයුත්තව ප්‍රත්‍යය වෙන හැටි සංසන්දනය කරලා බලද්දී සාමාන්‍යයෙන් දන්නේ නැති ගොඩක් අය හිතනවා මේ ඇඟේ හිත තිබෙනවා එතකොට මේ රූපෙත් එක්ක සිත මිශ්‍රවෙලා තියෙනවා කියලා. මේ ප්‍රත්‍යය ගැන දැන ගත්තහම තමයි දන්නේ සිත ඇඟ අස්සේ තිබුණත් රූපයත් එක්ක සම්පයුත්ත ගතියක් නොවෙයි විප්පයුත්තව තමා තිබෙන්නේ කියන එක. ඕක දන්නේ නැතිව ඉන්නකොට අපි හිතනවා හිතයි ඔක්කොම එකට කවලම් වෙලා තමයි මේක ක්‍රියාත්මක වෙන්නේ කියලා. නමුත් මේ ප්‍රත්‍යය ඉගෙන ගත්තට පස්සේ තව පොඩ්ඩක් පැහැදිලි උනා මේ රූපය කියන එක නාම ස්කන්ධයත් එක්ක විප්පයුත්ත ප්‍රත්‍යයක් තමයි තිබෙන්නේ ඒවගේම වත්ථු රූපයේත් විප්පයුත්ත ප්‍රත්‍යයෙන් තමයි සිත් හටගෙන යන්නේ කියන එක. තෙරුවන් සරණයි සවාමීන්වහන්ස.

<u>ස්වාමීන් වහන්ස</u> - ඇත්ත වශයෙන්ම අපේ බෲනෝ මහත්මයා එහෙම හිතපු එක හරිම හොඳයි. ඒ මහත්මයා අහපු සහ ඉදිරිපත් කරපු කරුණුත් එක්ක තවත් ටිකක් එකතු කරනවා නම් ලෝකයේ පෘතග්ජන මිනිස්සුන්ට ආත්මය කියන හැඟීම හිතෙන් හදාගෙන මවාගෙන තිබෙන්නා වූ ආත්මය කියන එක මිනිස්සු බලෙන් රූප වල තවරාගෙන තිබෙන්නේ. ඒකෙ ගාවලා අලවලා තිබෙන්නේ. ආත්මය කියන හැඟීම සමහර වෙලාවට නාමයයි රූපයයි දෙක එක්කාසු කරලා ඒ දෙකේ ගම් ගාවලා අලවලා තිබෙන්නේ. සමහර වෙලාවට එකක ගිහිල්ලා අලවනවා ආත්මීය දෘෂ්ඨිය. නැත්නම් රූපයක

තවරනවා. එහෙම නැත්නම් රූපයට ගාවලා ඒක රූප ගතියම කියලා කියනවා. එහෙම නැත්නම් චිත්ත ගතිය කියලා කියනවා. ඔය අපි මවපු දේවල් අපි හිතපු දේවල් කඩා වැටෙන්න ඔය විප්පයුත්ත ප්‍රත්‍යය ගැන හිතුවහම මේවා තිබෙනවා තමයි, තිබෙනවා උනාට මේවා තිබෙන්නේ එකකට එකක් උදව් වෙන විදියෙන් වෙනස්. දැන් වාහනයක් ගත්තහම රෝද 5 ක් තිබෙනවා එයින් හතරක් එක පැත්තකට කරකැවෙනවා එකක් එක පැත්තකට කරකැවෙනවා. ඒ කියන්නේ steering wheel එක කරකැවෙන්නේ නෑ රෝද කරකැවෙන පැත්තට. ඒක අමුතුයි. මේ ධර්ම වැඩ කරන්නේ එකට උනාට මේ ගොල්ලෝ මිශ්‍ර වෙන්නේ නෑ. රූපත් එක්ක තිබෙන කථාව තේරුම් ගන්න හරි උදව්වක් වෙනවා මේක. මේකත් පුංචි අතිරේක කෑල්ලක්. තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නය</u> - අවසරයි ස්වාමීන්වහන්ස ඔබ වහන්සේ කථා කළා උප්පත්ති අවස්ථා ගැනත්. එතකොට ස්වාමීන් වහන්ස මහා කුසල සිතකින් වගේ උප්පත්තියක් ගන්නවා කියලා උදාහරණයකට ගත්තොත් එතනදී සම්පයුත්ත ප්‍රත්‍යයත් විප්පයුත්ත ප්‍රත්‍යයත් දෙකම තිබෙනවාද? ඒ දෙකම එකම අවස්ථාවක බලපානවද? ඒක පොඩ්ඩක් පැහැදිලි කරලා දෙන්න ස්වාමීන්වහන්ස.

<u>පිළිතුර</u> - සම්පයුත්ත ප්‍රත්‍යයත් තිබෙනවා විප්පයුත්ත ප්‍රත්‍යයත් තිබෙනවා. තිබෙන්නේ මෙහෙමයි, අපි හිතමු කුසල් සිතක් පහළ කරනවා කියලා. ඒ අවස්ථාවේදී චිත්ත චෛතසික රූප කියලා තුනක් පහළ වෙනවා. චිත්ත චෛතසික ධර්මයෝ ටික සම්පයුත්ත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා. චිත්ත චෛතසික රූප ධර්මයෝ ටික ඒ ගොල්ලෝ එකවර්ගයේ නිසා සම්පයුත්ත උනාට ඒ චිත්ත චෛතසිකයෝ ටික රූපත් එක්ක සම්පයුත්ත වෙන්නේ නෑ. එතැන තමයි සම්පයුත්ත වෙන්නේ නැතුව තිබෙන්නේ. ඔය චිත්ත චෛතසික ටික පහළ වෙන්නේ නිකම්ම නොවෙයි. මොකක් හරි රූපකයක් ආධාර කරගෙනයි. අන්න ඒ ආධාර කරගෙන පහළ වෙනකොට ඒ ගොල්ලෝ සම්පයුත්ත උනත් ඒ ගොල්ලෝ ඉන්න තැන එක්ක මිශ්‍ර වෙන්නේ නෑ. හරියට තෙල් තාච්චියට වැටිලා කැවුම් බැදිලා යනවා. ඒවගේම හැන්දෙන් කැවුනුත් ගන්නවා තෙලුත් ගන්නවා නමුත් තාච්චිය එන්නේ නෑ. නමුත් තාච්චියේ තමයි තිබෙන්නේ. ඒවගේ නාම ධර්මයෝ පහළ වෙන රූප ධර්මයොත් එක්ක එකතු වෙන්නේ නෑ. එතැන විප්පයුත්තයි. එතැන සම්පයුත්තෙත් තිබෙනවා විප්පයුත්තෙත් තිබෙනවා. තෙරුවන් සරණයි!

<u>ජයනාත් මහත්මයා</u> - තෙරුවන් සරණයි ස්වාමීන් වහන්ස ඔබ වහන්සේ සෑහෙන උත්සාහයක් ගත්තා අපිට මේ කරුණු තව දුරටත් මේ කරුණු පැහැදිලි කරලා දෙන්න. ඔබ වහන්සේගේ කාල වෙලාව සලකලා අපිට අද සාකච්ඡාව නිමා කරන්න පුළුවන් කමක් තිබෙනවා ස්වාමීන් වහන්ස. ඒ නිසා ඔබ වහන්සේට ඉතාමත්ම ගෞරවයෙන් පුණ්‍යානුමෝදනා කරනවා මේ වගේ ගැඹුරු දහමක් සියුම් ලෙස තෝරා දෙන්න ඔබ වහන්සේ දරන උත්සාහය මම හිතන්නේ නැහැ අපිට වෙන තැනකින් ලැබෙනවා කියලා. මේක විශාල හොඳ අවස්ථාවක් මේ දහම් කරුණු තේරුම් ගන්න. ස්වාමීන්වහන්ස ඔබ වහන්සේට කෘතඥපූර්වකව පුණ්‍යානුමෝදනා කරමින් ඔබ වහන්සේටම යොමු වෙනවා අද දවසේ වැඩ සටහන නිමා කරන ලෙසට ස්වාමීන් වහන්ස තෙරුවන් සරණයි!

<u>ස්වාමීන් වහන්සේ</u> - හොඳයි, සැම දෙනාටම තෙරුවන් සරණයි! අපේ ශ්‍රද්ධාවන්ත පින්වතුන් ධර්ම මණ්ඩලයක් හැටියට එක්කාසු වෙලා මේ දම් සභාවේ මේ කථාව අහගෙන තේරුම් ගන්න උත්සාහ කළා. හැම දෙනාගේම සිත් ලොව්තුරා බුදුරජාණන්වහන්සේ දේශනා කොට වදාළ සාරිපුත්ත මහරහතන් වහන්සේ විසින් අපිට ගැලපෙන තරමින් විස්තරකොට වදාළ ධර්ම පාරාසයක අපේ පුංචි අහිංසක සිතුවිලි ක්‍රමයෙන් අපි එක්කාසු වෙන්න උත්සාහයක් දැරුවා. ඒ තුල ගොඩක් පිං සිද්ධ උනා කුසල් වැඩුනා කියලා මම විස්වාස කරනවා. ඉතින් මේ වගේ ඔවුනොවුන් නොදැක ඔවුනොවුන් නොපෙනී ඉඳගෙන මේ වගේ දහම් මණ්ඩලයක් හදාගෙන කටයුතු කරන්න ආරම්භක මහත්මයා තමයි ඒ පින්වත් ලලිත් දළුවත්ත මහත්මයා. ඒ පින්වත් මහත්මයාට පවුලේ සැම දෙනාටම මේ ධර්ම මණ්ඩපය එක්කාසු කරගෙන සංවිධානය කරගෙන කටයුතු කරන පින්වත් ජයන්ත මහත්මයාට ඒවාට

බොහෝම ආදරයෙන් කරුණාවෙන් ගෞරවයෙන් එක්කාසුවෙලා කටයුතු කරන අපේ මේ පින්වත් ධර්ම මණ්ඩලයේ සැම දෙනාටම අපි මෛත්‍රියෙන් ආශිර්වාද කරනවා.

ලලිත් මහත්මයාට ඒ පවුලේ සැම දෙනාට ජයන්ත මහත්මයාට ඒ වගේම සියලු දෙනාටම නිදුක් නිරෝගී දීර්ඝායුෂ වේවා! මේ වගේ ධර්ම කරුණු තව තව කථා කරන්න හිතන්න මෙනෙහි කරන්න සැම දෙනාටම ශක්තිය ලැබේවා! සියලු දෙනාගේම සිත්වල කෙලෙස් ගිනි නිවාගෙන මේ නාම රූප ධර්මයෝ හොඳට අවබෝධ කරගෙන මෙවායේ නොඇලී නොබැඳී මේවාගෙන් විනිර්මුත්ත වූ සිත් හදාගෙන සැම දෙනාටම ගුණ පුරාගෙන අමාමහ නිවනින් සැනසෙන්න ලැබේවා කියලා මෛත්‍රියෙන් පින්දෙමින් ප්‍රාර්ථනා කරනවා. අපි නැවතත් මේවාගේ ධර්ම සභාවකින් හමුවෙන බලාපොරොත්තුවෙන් අදට නවතිමු. හැමදෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!

සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ලබෙන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථේරානං - ආගතං පටිපටියා
සද්ධා සීලං දයා වාසං - බුද්ධ පුත්තං නමා මහං



ඉහත සඳහන් ධර්ම දේශනාව
අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.